සැ. ය. — 1995.12.22 දින අංක 903 දරන ගැසට් පත්‍රයේ III වැනි කොටස පළ නොකරන ලදී.

සත්‍ය පිටපතක් බවට සහතික කරමි.
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
දිනය: 16-07-08

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 904 - 1995 දෙසැම්බර් 29 වැනි සිකුරාදා - 1995.12.29

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස—පළාත් සභා

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගයකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ප්‍රකාශන ආදිය ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන පත්කිරීම් ආදිය ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... | 2680 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... | — |
| තනතුරු - ඇබෑර්තු ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — |
| කොටුපල්, රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

සැ. ය — මෙවර පළවන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභික නාමාවලියක් ඇතුළත් වේ.

යතිපතා නිකුත්වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගන ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි සෑම කොටසකම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේදී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා, වේලාව, ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාද දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාද දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර-එනම් 1996 ජනවාරි 04 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයට යා යුතු දැන්වීම් 1995 දෙසැම්බර් 22 වැනි දින දහවල් 12ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

නෙවිල් නානායක්කාර,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1995 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 8.

සභා පිටපතක බවට සහතික කරමි.

අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
දිනය: 16-07-08



| | පුනරාවර්තන වියදම් රු. | ප්‍රාග්ධන වියදම් රු. |
|---|---|---|
| *ශීර්ෂ 37 – කුඩා කාර්මාන්ත දෙපාර්තමේන්තුව :* | | |
| වැඩ සටහන 1 – කුඩා කර්මාන්ත අභිවර්ධනය හා උන්නතිය | 50,00,000 | – |
| *ශීර්ෂ 38 – 63 ප්‍රාදේශීය පරිපාලනය :* | | |
| 1 වැඩ සටහන – සාමාන්‍ය පරිපාලනය | 10,73,52,000 | – |
| *ශීර්ෂ 64– විවිධ සේවා :* | | |
| 1 වැඩ සටහන – මූදල් ආධාර හා විශේෂ පළාත් සභා සේවා හා වියදම් | 13,10,000 | 4,00,000 |

දෙවන උපලේඛනය

| ආයතනය | විෂය අංකය | පළාත් සභාවේ කටයුතු | පළාත් සභාවේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | පළාත් සභා කටයුතු හිඟුම්වලට බැර කළයුතු අවම සීමාව | පළාත් සභා කටයුතුවල හර ශේෂයන් ගේ උපරිම සීමාව |
|---|---|---|---|---|---|
| පළාත් සභාව ප්‍රධාන ලේකම් | 0001 | මන්ත්‍රීවරුන්ට විවිධ අත්තිකාරම් | 3,00,00,000 | 2,00,00,000 | 1,00,00,000 |
| | 0002 | පළාත් සභාවට මුදාහල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් හිඟුම | 9,00,00,000 | 3,00,00,000 | 6,00,00,000 |
| ප්‍රධාන අමාත්‍යාංශය | 0003 | යාන්ත්‍රි ඉංජිනේරු අංශය කළ වැඩ අත්තිකාරම් හිඟුම | 10,00,000 | 9,00,000 | 1,00,000 |
| | 0006 | මුද්‍රණාල ව්‍යාපෘතිය | 20,00,000 | 12,00,000 | 8,00,000 |
| | 0007 | පරිගණක පාඨමාලාව | 8,00,000 | 4,00,000 | 4,00,000 |
| කර්මාන්ත නිවාස, වෙළඳ හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය | 0004 | පේෂකර්මාන්ත වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය | 1,00,00,000 | 80,00,000 | 20,00,000 |
| | 0005 | කුඩාකර්මාන්ත වැඩපලවල් පිහිටුවීම හා පරිපාලනය | 1,00,00,000 | 50,00,000 | 50,00,000 |
| පළාත් පාලන, යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය | 0008 | බලවිත්ත පෙරනිම් කොන්ක්‍රීට් වැඩපල | 32,00,000 | 24,00,000 | 8,00,000 |

12-622/2

---

සබරගමුව පළාත් සභාව

සබරගමුව පළාත් සභාවේ 1995 අංක 02 දරන අධිකරණ දඩ හැරවීමේ ප්‍රඥප්තිය

සහතිකය සටහන් කළේ : 1995 අගෝස්තු 23 වන දින.

අනුමැතිය ලැබුනේ : 1995 සැප්තැම්බර් 27 වන දින.

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදි,

එම්. එම්. ශු. ධම්මික,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

සබරගමුව පළාතේ 1995 අංක 02 දරන අධිකරණ දඩ හැරවීමේ ප්‍රඥප්තිය

අධිකරණය විසින් නියම කරන ලද සබරගමුව පළාතේ 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තිය යටතේ අයකරගත් දඩ සහ දණ්ඩන මුදල් සබරගමුව පළාතේ පළාත් පාලන ආයතනවලට හැරවීමට විධිවිධාන සැලැස්වීම සඳහා වූ ප්‍රඥප්තියකි

සබරගමුව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය සබරගමුව පළාතේ 1995 අංක 02 දරන අධිකරණ දඩ හැරවීමේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය

සත්‍ය පිටපතක් බවට සහතික කරමි.

අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන්
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
දිනය: 16-07-08



අධිකරණ දඩ හා දණ්ඩන මුදල් පැවරීම.

2. සංශෝධිත පරිදි වූ සබරගමුව පළාතේ 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තිය අනුව පළාත් සභාව විසින්, පළාතේ පිහිටා ඇති අධිකරණය විසින් නියම කරන ලද දඩ හා දණ්ඩන මුදල් අයකරගෙන ඇති අවස්ථාවක, ඉහත කී පරිදි එම දඩ හෝ දණ්ඩන මුදල් අයකරගත් වර්ෂයේ දෙසැම්බර් මාසයේ තිස් එක් වන දිනයේ සිට අවුරුදු දෙකක කාලයක් ඇතුළත, අදාල පළාත් පාලන ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධාරියා විසින් ලිඛිතව පළාතේ අමාත්‍ය මණ්ඩලයේ මුදල් විෂය භාර අමාත්‍යවරයා වෙත කරනු ලබන ඉල්ලීමක් මත, පළාත් සභාව විසින් එම දඩ හෝ දණ්ඩන මුදල් අදාළ පළාත් පාලන ආයතනයට පැවරිය හැකිය.

අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ සහතිකය.

3. 2 වැනි වගන්තිය යටතේ වූ කිසිම ඉල්ලීමක් එම දඩ හෝ දණ්ඩන මුදල් ගෙවූ දිනය, එම මුදල් අධිකරණය විසින් පළාත් සභාවට ප්‍රේෂණය කළ දිනය සහ එම දඩ හෝ දණ්ඩන මුදල නියම කළේ කවර ආඥාපනතක් හෝ පනතක් යටතේ ද යන වග, එහි උපලේඛනයට විශේෂ යොමු කිරීමක් සහිතව ද එම දඩ හෝ දණ්ඩන මුදල් නියමකර අයකරගත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් ඒ කාර්යය සඳහා නම් කළ වෙනත් යම් නිලධරයකු විසින් සහතික කරනු ලැබ ඇත්නම් මිස, එවැනි ඉල්ලීමක් වලංගු නොවිය යුතුය.

අර්ථ නිරූපණය.

4. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ ප්‍රඥප්තියෙහි -

"ප්‍රධාන පරිපාලන නිලධරයා" යන්නෙන් -

(අ) මහ නගර සභාවක් සම්බන්ධයෙන් වූ විට, මහ නගර සභා කොමසාරිස්වරයා ද,
(ආ) නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් වූ විට එහි ලේකම්වරයා ද

අදහස් වෙයි ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූපවන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ;

"පළාත" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමු පළාත අදහස්වේ ;

"පළාත් සභාව" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාව අදහස් වේ.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

5. මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

12 - 622/3